# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

එම්.ජී.කේ දිසානායක
නො. 71/ඒ
ඇල්ලේකඩේ
විලානගම

<u>අභියාචක</u>

අභියාචනා අංකය :
**RTIC/Appeal/1571/2023**

එදිරිව

ඒෂියා බ්‍රෝඩ්කාස්ටින්ග්
කෝප්පරේෂන් ප්‍රයිවට් ලිමිටඩ්
35 සහ 37 වන මහල්
නැගෙනහිර කුළුණ
ලෝක වෙළෙඳ
මධ්‍යස්ථානය
කොළඹ 01

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී** :

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
5. ඒ.එම්. නහියා - කොමසාරිස්

**පෙනී සිටීම** :

අභියාචක සිටී. අභියාචක වෙනුවෙන් ජේ.පී.සී ලක්ෂාන් වික්‍රමසිංහ මයා පෙනී සිටී.

ඒෂියා බ්‍රෝඩ්කාස්ටින්ග් කෝප්පරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) තරංග දිනුෂ් ජයකොඩි මයා සහ නීතිඥ තිදස් හේරත් මයා පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** :

අභියාචක - ඉදිරිපත් කර ඇත (දාතම රහිතය)

පොදු අධිකාරිය - 2024.02.27, 2024.04.25

**විභාග කළ දිනය** : 2024.03.06, 2024.04.25

**තීරණය කළ දිනය** : 2024.06.20

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2023.09.19 දිනැතිව සිදු කරන ලද තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

(තොරතුරු වලට අදාළ කාල පරිච්ඡේදය - 2023.07.01 – 2023.08.31)

'... *1. 2023.08.23 දින හිරු රාත්‍රී 6.55 සහ රාත්‍රී 10.00 ප්‍රවෘත්ති ප්‍රකාශයක් තුළ විකාශය වූ "අලවතුගොඩ සාතන අභිරහස හෙළිවේ - සැමියා රිමාන්ඩ්" නම් ශීර්ෂගත ප්‍රවෘත්තියට අදාළ තොරතුරු ඔබ ආයතනය විසින් ලබා ගන්නා ලද්දේ කුමන පුද්ගලයෙකුගෙන්ද ? එම පුද්ගලයාගේ නම, තනතුර සඳහන් කරන්න.*

*2. උක්ත ප්‍රවෘත්තියට අදාළව අදාළ පුද්ගලයා විසින් ඔබ ආයතනය වෙත ලබා දුන් තොරතුර කුමක්ද? එහි ලිඛිත / මුද්‍රිත / රෙකෝඩනයක් තිබේ නම් එය ලබා දෙන්න.*

*3. උක්ත තොරතුර ලබා ගැනීමෙන් අනතුරුව එම තොරතුරේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට ඔබ ආයතනය කටයුතු කර ඇතිද? එසේ නිරවද්‍යතාවය තහවුරු කරගන්නා ලද්දේ නම් ඒ කුමන තැනැත්තෙකුගෙන්ද? කුමන ආකාරයෙන්ද?*

*4. අදාළ තොරතුර පිළිබඳ ප්‍රවෘත්තියක් නිර්මාණය කිරීමට පෙර ප්‍රවෘත්ති සංස්කාරක සහ ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයා විසින් ඒ පිළිබඳව වෙනමම යම් තහවුරු කිරීමක් සිදු කරගෙන ඇති ද?*

*5. 2023.08.23 වන දින හිරු රාත්‍රී පුවත් විකාශයන් දෙකට අදාළව ප්‍රවෘත්ති සංස්කාරකවරයා ලෙස සහ ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයා ලෙස කටයුතු කරන ලද තැනැත්තන් කවුරුන්ද ? ඔවුන්ගේ නම් ලබා දෙන්න.*

*6. උක්ත පළමු ප්‍රශ්නයේ සඳහන් කර ඇති ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් අලවතුගොඩ පොලිස් ස්ථානය මඟින් ඔබ ආයතනය කරුණු තහවුරු කිරීමක් සිදු කරගෙන ඇති ද? එසේ නම් ඒ කුමන නිළධාරියෙකුගෙන් කුමන වේලාවකදී ද ? එලෙස කරුණු තහවුරු කළ නිළධාරියාගේ නම / නම් ලබා දෙන්න.*

*7. අදාළ ප්‍රවෘත්තිය පළ කරන ලද අවස්ථාවේ සැමියා විසින් පොලිසියට පාපොච්චාරණයක් සිදු කරන ලද බවට ලිඛිත වාක්‍ය කණ්ඩයක් දර්ශනය කර ඇතිද?*

*8. එලෙස පාපොච්චාරණයක් සිදු කළ බවට ඔබ ආයතනය වෙත දැනුම් දෙන ලද්දේ කවුරුන් විසින් ද? එම තැනැත්තාගේ නම / තනතුර කුමක්ද?'*

තොරතුරු නිලධාරි විසින් තම තොරතුරු ඉල්ලීමට පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම මත අතෘප්තියට පත් අභියාචක විසින් පොදු අධිකාරියේ නම් කල නිලධාරි වෙත 2023.10.19 දිනැතිව අභියාචනයක් යොමු කර ඇත. නම් කළ නිලධාරිද පනත ප්‍රකාරව නියමිත

කාලය තුළ ඊට ප්‍රතිචාර දක්වා නොමැති වීම හේතුවෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2023.11.29 දිනැතිව මෙම කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කර ඇත.

2024.02.14 දිනැති කාර්යාල කාර්ය සටහන් අංක 2 අනුව අභියාචකට සහ පොදු අධිකාරියට විද්‍යුත් තැපැල් මගින් නොතිසි නිකුත් කර ඇත.

පොදු අධිකාරිය විසින් දාතම රහිත මූලික විරෝධතා ගොනු කිරීමක් සිදු කර ඇත. එකී ලිඛිත සැළකිරීම 2024.02.27 දින කොමිෂන් සභාව වෙත භාර දී ඇති බව එහි සඳහන් කොමිෂන් සභාවේ දින මුද්‍රාවෙන් පැහැදිලි වේ. එකී ලිඛිත සැළකිරීමෙහි පහත පරිදි කරුණු දක්වා ඇත.

> *'... 4. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතෙහි 3 (1) වගන්තිය යටතේ, පුරවැසියන්ට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඇත්තේ "**<u>පොදු අධිකාරියක් සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති</u>**" තොරතුරු වලට පමණි. " පොදු අධිකාරියක් " යන්න, පනතේ ඉතා නිශ්චිතව ම අර්ථ නිරූපනය කර ඇති අතර, එය පනතේ 43 වගන්තිය යටතේ, මෙසේ නිර්වචනය කර ඇත :-*
>
> *" පොදු අධිකාරිය" යන්නෙන් -*
>
> *(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ (ඉ) ඡේදය යටතේ නිශ්චිත ව දක්වා ඇති ප්‍රමාණයට හැර, 2007 අංක 7 දරන සමාගම් පනත හැර යම් ලිඛිත නීතියක් හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් මගින් හෝ යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක් හෝ කාර්යාලයක්:*
>
> *(ඉ) සිය කොටස් වලින් සියයට විසි පහක් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් හෝ අන්‍යාකාරයකින් පාලන අයිතියක් ඇති රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ රජය සහ රාජ්‍ය සංස්ථාවක් එකතුව දරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්.*
>
> *5. ඒ අනුව, සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගම් "පොදු අධිකාරියක්" යටතට ගැනෙන්නේ, එම පනතේ 43 වගන්තියේ (ඉ) උප වගන්තියේ "නිශ්චිත" ව දක්වා ඇති ප්‍රමාණයට පමණක් වන අතර, එහි අනෙකුත් උපවගන්ති යටතේ හෝ වෙනත් කිසිදු ආකාරයකට, පොදු අධිකාරියක් යන්නට ගැනෙන්නේ නැත.*
>
> *6. ඉහත සඳහන් කළ පරිදි, ඒෂියා බ්‍රෝඩ්කාස්ටින්ග් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් 100% පුද්ගලික හිමිකාරිත්වයක් සතු සීමිත වගකීම් සහිත පෞද්ගලික සමාගමක් වන අතර, යටතේ, පනතේ 43 වගන්තියේ (ඉ) උප වගන්තිය යටතේ පොදු අධිකාරියක් යන නිර්වචනයෙන් බැහැර වේ.*
>
> *7. තවද, ඒෂියා බ්‍රෝඩ්කාස්ටින්ග් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් පෞද්ගලික සමාගමක් වශයෙන් පෞද්ගලික ලාභ අරමුණු කරගෙන ක්‍රියාත්මක වන ආයතනයක් වන අතර, ව්‍යවස්ථාපිත හෝ පොදු කාර්තව්‍යයක් ඉටු කරන හෝ පොදු සේවාවක් සපයන හෝ ආයතනයක් ද නොවේ. එසේ හෙයින්, පනතේ 43 (උ) අදාළ වන්නේ ද නැත.*
>
> ..........................................................................................................

*13. ඉහත දක්වා ඇති මූලික විරෝධතා වලට අගති රහිතව, පහත පරිදි ප්‍රකාශ කර සිටිමු.*

*(a) අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ලබා දෙන ලද පුද්ගලයන් සහ ඒෂියා බ්‍රෝඩ්කාස්ටින්ග් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් අතර ඔවුන්ගේ අනන්‍යතාවය හෙළි නොකිරීම සඳහා භාරකාර සම්බන්ධයක් පවතින අතර, එවැනි අවස්ථාවල, එම තොරතුරු සපයන්නන්ගේ අනන්‍යතාවය පිළිබඳ තොරතුරු, රහසිගතව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. එම නිසා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5 (1) (2) (උ) යටතේ අදාළ තොරතුරු හෙළි කිරීමේ හැකියාවක් හෝ නෛතික බැඳීමක් ඒෂියා බ්‍රෝඩ්කාස්ටින්ග් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් වෙත කිසි සේත්ම නොමැත.*

*(b) එම තොරතුරු හෙළිදරව් කිරීම මගින් දැනට සිදු වී ඇති අපරාධයක වරදකරුවන්ට එරෙහිව නඩු පැවරීම සම්බන්ධයෙන් බලවත් අගතියක් සිදු වන අතර, නීතිය බලාත්මක කිරීමට අදාළ තොරතුරු පිළිබඳ රහසිගත මූලාශ්‍රයක අනන්‍යතාවය හෙළිදරව් වේ. එසේ හෙයින්, එම මූලාශ්‍ර හෙළි කිරීමට XXX කිසි සේත්ම නොහැකි වන අතර, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5 (1) (2) (ඌ) යටතේ, ඒ සඳහා කිසිදු නෛතික බැඳීමක් ද නොමැත.*

*ඉහත දක්වා ඇති කරුණු මත තොරතුරු සඳහා වන ඉල්ලීම හෝ මෙම අභියාචනය පවත්වාගෙන යා නොහැකි බවත්, එම නිසා එය නිෂ්ප්‍රභ කළ යුතු බවත්, ගෞරවයෙන් සැල කර සිටිමු. ...'*

මෙම අභියාචනය පළමු වරට 2024.03.06 දිනැතිව විමසීමට ගත් අතර එදින කාර්ය සටහනේ පහත පරිදි සඳහන් පරිදි වේ.

*"දෙපාර්ශවයම ලිඛිත සැළකිරීම් ගොනු කර නැත. ඒ අනුව ඒෂියා බ්‍රෝඩ්කාස්ටින්ග් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ්හි ලිඛිත සැළකිරීම් 2024.03.26 වන දින හෝ ඊට ප්‍රථම අභියාචකට ද පිටපත් සහිතව කොමිෂන් සභාව වෙත ගොනු කළ යුතු අතර අභියාචකගේ ප්‍රති ලිඛිත සැළකිරීම් 2024.04.21 වන දින හෝ ඊට ප්‍රථම ඒෂියා බ්‍රෝඩ්කාස්ටින්ග් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත පිටපත් සහිතව කොමිෂන් සභාව වෙත ගොනු කළ යුතුය."*

අභියාචක වෙනුවෙන් නීතිඥ මාධව ඊරියගම මහතා විසින් ඔහුගේ අත්සන හෝ දිනය රහිතව ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයක් ඉදිරිපත් කර ඇති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

පොදු අධිකාරිය විසින්ද 2024.04.25 දිනැතිව සිය ලිඛිත දේශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර සිටී.

මෙම අභියාචනය 2024.04.25 දිනැතිව නැවත විමසීමට ගන්නා ලද අතර දෙපාර්ශවයම ලිඛිත සැළකිරීම් ගොනු කර ඇති බැවින් කොමිෂන් සභාවේ තීරණය ප්‍රකාශයට පත් කිරීම ඉදිරියට කල් තබමින් විමසීම අවසන් කරන ලදී.

## සළකා බැලීම

අභියාචකගේ 2023-09-19 දිනැති තොරතුරු ඉල්ලීම සඳහා ආසියානු මාධ්‍ය ජාලය ආයතනය ප්‍රතිචාර දක්වා නොමැති බැවින් 2023-10-19 දින අභියාචක නම් කල නිලධාරී වෙත අභියාචනයක් සිදු කර ඇත. එම අභියාචනය සඳහා නම් කල නිලධාරීද ප්‍රතිචාර දක්වා නොමැත. ඒ අනුව අභියාචක විසින් 2023-11-29 දින මෙම කොමිෂන් සභාව වෙත අභියාචනා කර ඇත.

කොමිෂන් සභාව විසින් අභියාචනා විභාගය සඳහා නොතිසි නිකුත් කිරීමෙන් අනතුරුව ආසියානු මාධ්‍ය ජාලය ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරි / අධ්‍යක්‍ෂක විසින් දාතම රහිතව කොමිෂන් සභාව වෙත මූලික විරෝධතාවයක් ඉදිරිපත් කර ඇත. (මෙම මූලික විරෝධතාව 2024-02-27 දින කොමිෂන් සභාව වෙත ලැබී ඇති බව දින මුද්‍රාවෙන් පැහැදිලි වේ).

තම ආයතනය සියයට සියයක්ම පුද්ගලික ආයතනයක් බවත්, 2016 අංක 12 දරණ තොරතුරු දූනගැනීමේ අයිතිවාසිකම් පනතේ 3(1) වගන්තිය අනුව පුරවැසියන්ට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම පවතින්නේ "පොදු අධිකාරියක් සන්තකයේ, භාරයේ හෝ පාලනයේ පවතින තොරතුරු" සඳහා බවත්, තම ආයතනය තොරතුරු දූනැගනීමේ පනතේ 43 වන වගන්තියේ දක්වන අර්ථ නිරූපනයට අනුව පොදු අධිකාරියක් නොවන බැවින් තමන් මෙම තොරතුරු ලබා දීමට බැඳීමක් නොමැති බවත් මෙම මූලික විරෝධතාවය මගින් දක්වා ඇත. එසේම අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ලබා දීම මගින් මාධ්‍ය අයාතනයක ප්‍රවෘත්ති සපයන පුද්ගලයන්ගේ තොරතුරු බාහිර පාර්ශවයන්ට හෙලිදරව් කිරීමට බැඳීමක් නොමැති බවත්, එම මූලික විරෝධතාවන්ට අගති රහිත බව දක්වමින් මෙම තොරතුරු හෙලිදරව් කිරීම තොරතුරු දූනගැනීමේ අයිතිවාසිකම් පනතේ (5)(1)(2)(උ) වගන්තිය යටතේ සහ 5(1)(2)(ඌ) වගන්තිය යටතේ තොරතුරු ඉල්ලීමක් ප්‍රතික්ෂේප කල හැකි අවස්ථාවක් වන බවත් ප්‍රකාශ කර ඇත.

මෙම අභියාචනය කොමිෂන් සභාව ඉදිරියේ 2024-03-06 දින කැඳවූ අවස්ථාවේදී ද ආසියානු මාධ්‍ය ජාලය ආයතනය කොමිෂන් සභාව වෙත සැලකර සිටියේ තමන් තොරතුරු දූනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ පොදු අධිකාරියක් නොවන බවය. ඒ අනුව ආසියානු මාධ්‍ය ජාලය ආයතනයේ ලිඛිත සැලකිරිම් 2024-03-26 දිනට ප්‍රථම අභියාචකට පිටපත් සහිතව කොමිෂන් සභාවට යොමු කරන ලෙසත්, අභියාචකගේ ලිඛිත සැලකිරීම් 2024-04-21 දිනට පෙර ආසියානු මාධ්‍ය ජාලයට පිටපත් සහිතව කොමිෂන් සභාව වෙත ගොනු කිරිමටත් දෙපාර්ශවයට උපදෙස් දෙන ලදී.

ආසියානු මාධ්‍ය ජාලය ආයතනය විසින් 2024-04-25 දාතම යටතේ ඉදිරිපත් කර ඇති තම ලිඛිත දේශනයද අභියාචක වෙනුවෙන් නීතිඥ මාධව ඊරියගම මහතා විසින් ඔහුගේ අත්සන හෝ දිනය රහිතව ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයද කොමිෂන් සභාව විසින් සළකා බලන ලදී.

ආසියානු මාධ්‍ය ජාලය ආයතනය විසින් මූලික විරෝධතා ලෙස 2024-02-27 දින සිදු කරන ලද සැලකිරීම මගින් සහ 2024-04-25 දින සිදු කරන ලද ලිඛිත සැලකිරීම මගින් ප්‍රකාශ කර ඇත්තේ තමන් පුද්ගලික ආයතනයක් බවත් 2016 අංක 12 දරණ තොරතුරු දූනගැනීමේ අයිතිවාසිකම් පනතේ 43 වන වගන්තියේ සඳහන් වන පොදු අධිකාරිය යන අර්ථ නිරූපණයට ආසියානු මාධ්‍ය ජාලය ආයතනය අයත් නොවන බවත්ය. විශේෂයෙන්ම තමන් 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ස්ථාපනය කරන ලද සමාගමක් වන අතර සියලුම කොටස් පුද්ගලික කොටස්කරුවන්ට අයත් බවත් රජයට කිසිදු කොටසක් අයත් නොවන බවත් සිය ලිඛිත දේශනය මගින් ප්‍රකාශ කර ඇති අතර ඒ බව සනාථ කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කල සහතිකය සහ කොටස් හිමියන්ගේ ලේඛනයද ඉදිරිපත් කර ඇත. විශේෂයෙන්ම තොරතුරු දූනගැනීමේ අයිතිවාසිකම් පනතේ 43 වගන්තියේ පොදු අධිකාරිය පිලිබඳ නිර්වනයේ "උ" කොටසට තමන් අයත් නොවන බවත් තමන් වෙත ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් බලපත්‍රයක් නිකුත් කර ඇති නමුත් තමන් ව්‍යවස්ථාපිත හෝ

මහජන කාර්යයක් හෝ සේවාවන් ඉටු නොකරන බවත්, ඒ අනුව තමන් පොදු අධිකාරියක් ලෙස නොසැලකිය යුතු බවත් දක්වා ඇත.

එසේම එකී මූලික විරෝධතාවයන්ට අගතියක් නොවන පරිදි ආසියානු මාධ්‍ය ජාලය ආයතනය සිය ලිඛිත දේශනය මගින් ප්‍රකාශ කර ඇත්තේ අභියාචකගේ තොරතුරු ඉල්ලීමේ අයිතම අංක 1 සිට 8 දක්වා සඳහන් තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5(1)(උ) වගන්තිය සහ 5(1)(අ) වගන්තිය යටතේ ලබා දීම ප්‍රතික්ෂේප කල හැකි බවයි. විශේෂයෙන්ම මාධ්‍ය ආයතනයක් සිය මූලාශ්‍ර හෙළිදරව් කිරීම මගින් යුරෝපියානු මානව හිමිකම් සම්මුතියේ 10 වන ව්‍යවස්ථාව උල්ලංඝනය වන බවට තීරණය කල Goodwin vs. United Kingdom නැමති නඩු තීන්දුවේ සඳහන් කරුණුද 1972 අංක 5 දරණ පුවත්පත් මණ්ඩල නීතියේ 32 වගන්තියේ සඳහන් කරුණුද සිය ලිඛිත දේශන මගින් ඉදිරිපත් කර ඇත.

මේ අනුව මෙම අභියාචනය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ මූලික කාර්යය වනුයේ ආසියානු මාධ්‍ය ජාලය ආයතනය පනතේ 43 වන වගන්තියට අනුව පොදු අධිකාරියක් වන්නේද යන්න තීරණය කිරීමයි.

ආසියානු මාධ්‍ය ජාලය ආයතනය ලිඛිත දේශන වලට අනුව එය 2007 අංක 7 දරණ සාමාගම් පනත යටතේ ලියාපදිංචි ආයතනයක් වන අතර 1982 අංක 6 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යටතේ විකාශන බලපත්‍රයක් ලබාගෙන රූපවාහිනී විකාශන කටයුතු කරන ආයතනයකි. ඒ බව සනාථ කිරීම සඳහා ආසියානු මාධ්‍ය ජාලය ආයතනය ආයතනය අදාල සහතික පත්‍ර වල සහතික පිටපත්ද ඉදිරිපත් කර තිබේ. පොදු අධිකාරිය විශේෂයෙන්ම දක්වා ඇත්තේ තමන් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 43 වගන්තියේ පොදු අධිකාරිය අර්ථ නිරූපණය කර ඇති "උ" කොටසට නොවැටෙන ආයතනයක් බවයි. එකී "උ" කොටසේ සඳහන් වන්නේ

*"ආණ්ඩුව හෝ එහි නියෝජ්‍යායතනයක හෝ පළාත් පාලන ආයතනයක කොන්ත්‍රාත්තුවක්, හවුල් ව්‍යාපාරයක්, ගිවිසුමක් හෝ බලපත්‍රයක් යටතේ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයක් ඉටුකරන එහෙත් ඒ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයන්ගෙන් හෝ පොදු සේවාවන්ගෙන් ආවරණය වූ ක්‍රියාකාරකම් ප්‍රමාණයකට පමණක් සීමා වූ පෞද්ගලික හිමිකාරීත්වයක් හෝ සංවිධානයක්;"* පොදු අධිකාරියක් ලෙස අර්ථ නිරූපණය වන බවයි.

මේ අනුව යම් පෞද්ගලික හිමිකාරීත්වයක් හෝ සංවිධානයක්;

- ආණ්ඩුව හෝ එහි නියෝජ්‍යායතනයක හෝ පළාත් පාලන ආයතනයක කොන්ත්‍රාත්තුවක්, හවුල් ව්‍යාපාරයක්, ගිවිසුමක් යටතේ ව්‍යවස්ථාපිත කර තිබේනම්, හෝ
- ආණ්ඩුව හෝ එහි නියෝජ්‍යායතනයක හෝ පළාත් පාලන ආයතනයක බලපත්‍රයක් යටතේ ව්‍යවස්ථාපිත කර තිබේනම්, හෝ
- පොදු කර්තව්‍යයක් ඉටුකරන එහෙත් ඒ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයන්ගෙන් හෝ පොදු සේවාවන්ගෙන් ආවරණය වූ ක්‍රියාකාරකම් ප්‍රමාණයකට පමණක් සීමා වූ
  යන ක්‍රියාකාරකම්වලින් එකකට අයත් වන්නේ නම් පනතේ 43 වගන්තියේ පොදු අධිකාරිය යන අර්ථ නිරූපණයේ "උ" කොටසට අයත් ලෙස සැලකිය හැකිය.

මෙම ආසියානු මාධ්‍ය ජාලය ආයතනය 1982 අංක 6 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යටතේ බලපත්‍ර ලබාගෙන ව්‍යාපාර කටයුතු කරන ආයතනයකි.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 28 (1) වන වගන්තියෙහි දැක්වෙන්නේ;

*"මේ පනත යටතේ පිහිටුවනු ලබන සංස්ථාව හැර වෙනත් කිසිම තැනැත්තකු විසින් ඒ තැනැත්තා අමාත්‍යවරයාගෙන් බලපත්‍රයක් ලබාගෙන ඇති නම් මිස රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් පවත්වාගෙන නොයා යුතුය"* යනුවෙනි.

එසේම එහි 28(2) වගන්තියේ දැක්වෙන්නේ;

*"අමාත්‍යවරයා විසින් සංස්ථාව විමසා පුද්ගලික රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා යම් තැනැත්තෙකුට බලපත්‍රයක් නිකුත් කල හැකිය"* බවයි.

එසේම එහි 28(3) වගන්තියේ දැක්වෙන්නේ *"බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන තැනැත්තකුට පුද්ගලික රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් පිහිටුවීමේ හා පවත්වාගෙන යාමේ කාර්යය සඳහා යුක්ති සහගතව අවශ්‍ය විය හැකි යම් කාර්මික මුදල් හා වෘත්තීය සුදුසුකම් ඇති බවට සෑහීමකට පත්වන්නේ නම් මිස අමාත්‍යවරයා විසින් කිසිම බලපත්‍රයක් නිකුත් නොකරනු ලැබිය යුතු ය"* යනුවෙනි.

මේ අනුව ආසියානු මාධ්‍ය ජාලය ආයතනය ස්ථාපනය කර ඇත්තේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 28 වන වගන්තිය අනුව ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යවරයා විසින් ලබා දුන් බලපත්‍රයක් අනුව බව පැහැදිලිය. එසේම ජනමාධ්‍ය අමාත්‍යංශය රජය සතු ආයතනයකි. එබැවින් ආසියානු මාධ්‍ය ජාලය "ආණ්ඩුව හෝ එහි නියෝජ්‍යායතනයක හෝ පළාත් පාලන ආයතනයක බලපත්‍රයක් යටතේ ව්‍යවස්ථාපිත කර තිබේනම්" ලෙස සැලකිය හැකි බැවින් එය 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 43 වන වගන්තියේ පොදු අධිකාරිය යන අර්ථ නිරූපණය යටතේ එන "උ" කොටස යටතේ වන පොදු අධිකාරියක් බවට කොමිෂන් සභාව තීරණය කරයි.

එයට අමතරව මෙම ආසියානු මාධ්‍ය ජාලය සඳහා ශ්‍රී ලංකා ජාතික රූපවාහිනී සංස්ථා පනත යටතේ නිකුත් කර ඇති විකාශන බලපත්‍රයේ (ආසියානු මාධ්‍ය ජාලයේ ලිඛිත දේශනයේ ආර් 6) අංක 9 (iv) ට අනුව විකාශණ කුලුණු සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් වෙනම අවසරයක් ලබාගත යුතුය.

1996 අංක 27 දරණ සංශෝධන පනතින් සංශෝධිත 1991 අංක 25 දරණ විදුලි සංදේශ නියාමන පනතේ 22 වන වගන්තිය මගින් ගුවන් විදුලි තරංග සඳහා බලපත්‍ර ලබා දීමට අදාල නීතිමය ප්‍රතිපාදන දක්වා තිබේ. එහි 22(අ) වගන්තිය අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බලපත්‍රයක් නොමැතිව කිසිදු පුද්ගලයකු ගුවන් විදුලි විකාශනයක් පවත්වා ගෙන නොයා යුතු බව දැක්වේ.

1997 වසරේදී රජය විසින් ඉදිරිපත් කල විකාශන අධිකාරි පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේදී (SC SD 1/97 -15/97 S.C.M. 05-05-1997) ශ්‍රේෂ්ඨාධිකරණ ඉන්දීය නඩු තීන්දුවක් වූ Secretary Ministry of Information and Broadcasting v. Cricket Association of Bengal (ibid) තීන්දුවේ දී සවාන්ඩ් විනිසුරුවරයා ප්‍රකාශ කල,

"ගුවන් විදුලි තරංග/තරංග ආයාමයන් මහජන දේපළක් බවට සැකයක් නොමැත. එසේම එය සීමිතය. එබැවින් එය ඔවුන් මහජනයාගේ උපරිම යහපත පිණිස යොදාගත යුතුය ---" යන සඳහන මෙහිදී කොමිෂන් සභාවේ සැලකිල්ලට භාජනය වේ. ඒ අනුව රජය විසින් බලපත්‍රයක් මත වෙන් කරන ලද ගුවන් විදුලි තරංග භාවිතා කරමින් "හිරු" නැමති රූපවාහිනී විකාශනය සිදු කරන ආසියානු මාධ්‍ය ජාලය මහජන කාර්යයක් සිදු කරන ආයතනයක් බවට නිර්වචනය කල හැකිය.

ඒ අනුව ආසියානු මාධ්‍ය ජාලය 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 43 වගන්තියේ පොදු අධිකාරිය යන නිර්වචනයේ සඳහන් වන "පොදු කර්තව්‍යයක් ඉටු කරන එහෙත් ඒ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයන්ගෙන් හෝ පොදු සේවාවන්ගෙන් ආවරණය වූ ක්‍රියාකාරකම් ප්‍රමාණයකට පමණක් සීමා වූ" යන කොටස යටතේද ආසියානු මාධ්‍ය ජාලය පොදු අධිකාරියක් බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාව විසින් ඒ අනුව මෙම පොදු අධිකාරිය වෙත අභියාචක විසින් සිදු කර ඇති තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට ගන්නා ලද තීරණය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අනුකූල වන්නේ දැයි සලකා බලන ලදී. අභියාචකගේ තොරතුරු ඉල්ලීමේ අයිතම 4 සහ 5 හැර අනෙක් සියලුම අයිතම වලින් ඉල්ලා ඇත්තේ පොදු අධිකාරිය යටතේ විකාශනය කරන හිරු නාලිකාවේ ප්‍රවෘත්ති විකාශනයක ප්‍රවෘත්තියකට අදාල තොරතුරු සැපයූ මූලාශ්‍ර වලට අදාල තොරතුරු වේ. එම තොරතුරු අදාල පුද්ගලයන් විසින් මෙම පොදු අධිකාරිය වෙත සපයා ඇත්තේ විශ්වාසනීය සබඳතාවයන් මතය. එබැවින් එම තොරතුරු ලබා දීම 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5(1) (උ) භාරකාර සම්බන්ධතාවයක් පැවතීම හේතුවෙන් එම තොරතුරු රහසිගතව තබා ගැනීම අවශ්‍ය වන අවස්ථාවක දී;" යන අවස්ථාව යටතේ ප්‍රතික්ෂේප කල හැකි තොරතුරු වන බවට පොදු අධිකාරියේ ස්ථාවරය සමග කොමිෂන් සභාව එකඟ වේ.

නමුත් අභියාචකගේ තොරතුරු ඉල්ලීමේ අයිතම අංක 4 මගින් ඉල්ලා ඇත්තේ අදාල ප්‍රවෘත්තිය සංස්කාරකවරයා විසින් තහවුරු කරගෙන තිබේද යන්නයි. එසේම එහි අයිතම අංක 5 මගින් ඉල්ලා ඇත්තේ අදාල ප්‍රවෘත්තිය විකාශනය කල දිනයේ සේවය කල ප්‍රවෘත්ති සංස්කාරකවරයා සහ ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයාගේ නම් ය. එම පුද්ගලයන් පොදු අධිකාරියේ සේවකයන්ය. එම සේවකයන් දෙදෙනාගේ නම් හෙලිදරව් කිරීම මගින් පනතේ 5(1)(උ) වගන්තියේ දක්වන ආකාරයේ රහසිගතව තබාගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනගී. එබැවින් එම තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5(1) (උ) වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කිරීමේ තීරණය සමග කොමිෂන් සභාවට එකග විය නොහැක.

එසේ අභියාචකගේ තොරතුරු ඉල්ලීමේ අයිතම අංක 4 සහ 5 මගින් ඉල්ලා ඇති තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5(1) වගන්තියේ තොරතුරු ඉල්ලීමක් ප්‍රතික්ෂේප කල හැකි කිසිදු අවස්ථාවකට නොවැටෙන බවද කොමිෂන් සභාව තීරණය කරයි.

එබැවින් අභියාචකගේ 2023-09-19 දින දරණ තොරතුරු ඉල්ලීමේ අයිතම අංක 4 සහ 5 හි සඳහන් තොරතුරු මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව 2024 ජූලි මස 20 වන දිනට ප්‍රථම අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරියේ සමූහ ප්‍රධාන විධායක නිලධාරී වින්සන්ට් සිල්වා මහතා විසින් ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූල වීම පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවකදී 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වන වගන්තියේ විධිවිධාන පරිදි පොදු අධිකාරියට සහ එහි තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට සහ ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරමු.

එසේම, "2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති (ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටිය)" රීති මාලාවේ 11 වන රීතිය යටතේ උක්ත තොරතුරු මුදා හැරීමේදී පොදු අධිකාරියට ගාස්තු අය කිරීමේ හැකියාව නොලැබෙන බවද මෙහිලා වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමු.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරී සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.

.............................................................
විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික)- සභාපති

.............................................................
විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්

..............................................................
නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්

.............................................................
නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

...........................................................
ඒ.එම්. නහියා - කොමසාරිස්